# බළන්ගොඩ නගර සභාව
## ටෙන්ඩර් දැන්වීම

**බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැළ අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය බදු දීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම.**

2023 ජූලි මස 27 වන දින සිට 2024 ජූලි මස 26 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන කුකුළු මස් කඩ කාමරය බදු දිම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි දිසානායක මුදියන්සේලාගේ ජනිත් උදයංග ධර්මරත්න වන මා විසින් 2023 ජුනි මස 27 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරීම**

2023 ජුනි මස 26 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දි නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම**

2023 ජුනි මස 27 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ ලේකම් බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2023 ජුනි මස 27 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරීම**

2023 ජුනි මස 27 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

උප ලේඛනය

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01. | පොදු වෙළඳසැළ අංක 17 කුකුළු මස් කඩ කාමරය | රු.10000.00 | රු.1000.00 | රු.33000.00 |

විශේෂ කොන්දේසි:

- ✓ ටෙන්ඩර් පත් යොමු කිරීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය.
- ✓ ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදලට හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- ✓ තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක (03) කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගැනීමෙන් පසු පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එකවර ගෙවා 2023 ජූලි 26 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතු ය.
- ✓ සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලංගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.
- ✓ ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම් පත්‍රය සමඟ ලබාදෙනු ලැබේ.
- ✓ වැඩි විස්තර සඳහා සතියේ දිනවල කාර්යාල වේලාව තුලදී විමසන්න.

2023 ජුනි මස 06 වන දින
බළන්ගොඩ නගර සභාවේදීය.

ඩී.එම්.ජේ.යූ ධර්මරත්න,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි ,
බළන්ගොඩ නගර සභාව